# උතුරු මැද පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව

## සී/ස විවිධ සේවා සමුපකාර සමිතිවල පුරප්පාඩු වී ඇති තනතුරු සඳහා බඳවා ගැනීම

උතුරු මැද පළාත තුළ පිහිටා ඇති පහත සඳහන් සී/ස විවිධ සේවා සමුපකාර සමිතිවල පුරප්පාඩු වී ඇති සාමාන්‍යාධිකාරී තනතුරු සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ඇති උතුරු මැද පළාත තුළ පදිංචි අයදුම්කරුවන්ගෙන් 2023-01-13 දින දක්වා අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

**01. සාමාන්‍යාධිකාරී තනතුරු පුරප්පාඩු වී ඇති විවිධ සේවා සමුපකාර සමිති.**

| අංකය | සමුපකාර සමිතියේ නම | ශ්‍රේණිගත කිරීම | පුරප්පාඩු තනතුර |
|---|---|---|---|
| 01 | සී/ස නුවරකලාවිය පේෂ කාර්මිකයින්ගේ සමුපකාර සමිතිය | සී ශ්‍රේණිය | සාමාන්‍යාධිකාරී |
| 02 | සී/ස කැකිරාව විවිධ සේවා සමුපකාර සමිතිය | ඩී ශ්‍රේණිය | සාමාන්‍යාධිකාරී |

**02. සාමාන්‍යාධිකාරී තනතුර සඳහා අධ්‍යාපන සුදුසුකම්**

01. පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් වාණිජවේදී හෝ ව්‍යාපාර කළමනාකරණ උපාධියක් ලබා තිබීම. (රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක කළමනාකරණ මට්ටමේ වසර 02 ක පළපුරුද්ද ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ) හෝ

02. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනයේ ව්‍යාපාර අධ්‍යයන උසස් ඩිප්ලෝමාව ලබා තිබීම.

**03. සාමාන්‍යාධිකාරී තනතුරේ වැටුප් පරිමාණයන් :**

| ඒ ශ්‍රේණිය | බී ශ්‍රේණිය | සී ශ්‍රේණිය | ඩී ශ්‍රේණිය |
|---|---|---|---|
| 40850 - 47750<br>8 X 425 - 7 X 500 | 35850 - 42750<br>8 X 425 - 7 X 500 | 30850 - 37750<br>8 X 425 - 7 X 500 | 25850 - 32750<br>8 X 425 - 7 X 500 |

## පොදු කොන්දේසි :

**01. වෙනත් සුදුසුකම් :**

i. වයස් සීමාව : 2023-01-13 දිනට වයස අවුරුදු 22-45 අතර වීම.

ii. 2023-01-13 දිනට පූර්වාසන්න අවුරුදු 03 ක කාලයක් උතුරු මැද පළාත තුළ ස්ථිර පදිංචිය තහවුරු වීම.

**02. අයදුම්පත් එවීම**

i. අයදුම්පත් උතුරු මැද පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවෙන් හෝ පළාත තුළ පිහිටි ඕනෑම විවිධ සේවා සමුපකාර සමිතියකින් ලබාගත හැක. එම අයදුම්පත් ලේකම්, සමුපකාර සේවක කොමිෂන් සභාව, 352, මෛත්‍රීපාල සේනානායක මාවත, අනුරාධපුර යන ලිපිනයට 2023-01-13 දින හෝ එදිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ ඉහළ වම් කෙළවරේ, සමිතියේ නම හා තනතුර දැක්විය යුතුයි.

ii. එක් අයදුම්කරුවෙකු සමිති කිහිපයකට හෝ තනතුරු කිහිපයකට අයදුම් කරන්නේ නම් එක් එක් සමුපකාර සමිතියේ එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත් යොමු කළ යුතුය.

**03.** පුරප්පාඩු සියල්ල හෝ කිසියම් සංඛ්‍යාවක් පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය උතුරු මැද පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව සතුවේ.

**(ටී.එම්.ජී.එන්.ජේ. මල්වැව),**
**ලේකම්, සමුපකාර සේවක කොමිෂන් සභාව, උතුරු මැද පළාත.**
**2022-12-13 දින අනුරාධපුරදීය.**